**වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**

**ජනතා වතු සංවර්ධන මණ්ඩලය**

**ඇබෑර්තු**

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගන්නා ලද අයදුම්කරුවන් රජය විසින් නිකුත් කරන ලද හා ඉදිරියේදී නිකුත් කිරීමට අපේක්ෂිත අණ පණත් හා ආයතනික නීති රීති, රෙගුලාසි හා ප්‍රතිපත්තිවලට අනුකූලව තනතුරට අදාල කාර්යයන් ඉටුකිරීමට මනා හැකියාවක් ඇති අය විය යුතුය.

<u>1. කළමනාකරු - වැවිලි</u>

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්මය / වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 )**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. "කණිෂ්ඨ කළමනාකාර" **JM** සේවා ශ්‍රේණියෙහි අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

<u>කළමනාකරු - පාරිභෝගික - 01 තනතුරු</u>

**බාහිර අයදුම්කරුවන් :**

**සුදුසුකම් :**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අවසන් පරීක්ෂණය සමත් වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

| | | |
|---|---|---|
| සේවා ශ්‍රේණිය | : | ජ්‍යෙෂ්ඨ කළමනාකාර |
| වැටුප් තලය | : | MM 1-1 - රු. 91,690/-10 x 2,480/-15 x 3,450/- රු. 168,240/- |
| වයස | : | අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩිවිය යුතුය. |

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 )**

**සුදුසුකම් :**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. "කණිෂ්ඨ කළමනාකාර" JM සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

<u>කළමනාකරු (නීති හා ඉඩම්) – 01 තනතුරු</u>

**සුදුසුකම්**

බාහිර අයදුම්කරුවන්

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී උපාධිය සමග ඇටර්නි බලපත්‍රය ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

**සුදුසුකම්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

| | | |
|---|---|---|
| සේවා ගණය | : | ජ්‍යෙෂ්ඨ කළමනාකාර |
| වැටුප් තලය | : | MM 1-1 රු. 91,690/-10 x 2,480/-15 x 3,450/- රු. 168,240/- |
| වයස | : | අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩිවිය යුතුය. |

<u>සහකාර අභ්‍යන්තර විගණක - 01 තනතුරු</u>

**සුදුසුකම්**

බාහිර අයදුම්කරුවන් ( පහත 1 හෝ 2 )

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය, වාණිජවේදී, ව්‍යාපාර පරිපාලනය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට වෙනත් උපාධියක් ලබා තිබීම.

2. තනතුරට අදාල විෂය ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් ( පහත 1 හෝ 2)

**සුදුසුකම්**

1. ඉහත සහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. ' කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන' (MA 1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

| | | |
|---|---|---|
| සේවා ගණය | : | කණිෂ්ඨ කළමනාකාර |
| වැටුප් තලය | : | JM 1-1 රු. 72,650/- 10 x 1,360/- 18 x 2,040/- රු. 122,970/- |
| වයස | : | අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩිවිය යුතුය. |
| සේවා ස්ථානය | : | හන්තාන කාර්යාලය, හන්තාන |

පොදු

**පත්වීමේ ස්වභාවය** : ස්ථිර සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතයි.

**සෑම අයදුම්කරුවෙකුම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරී කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

iv. අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව සියළුම අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය.

සුදුසුකම් ඇති අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු නිළධාරීන් තෝරාගනු ඇත. අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්ද සහිතව සකස් කරන ලද අයදුම්පත 2025.06.14 වන දින හෝ ඊට සභාපති, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, 55/75, වොක්ස්හෝල් පටුමග, කොළඹ 02 යන ලිපිනයට තැපැලෙන් එවිය යුතු අතර ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ සඳහන් කල යුතුය.

සභාපති

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

2025.05.30